55

00085

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය 2011/2012**

**අන්තර්ජාතික මානව හිමිකම් නීතිය - LWU 3325/4325**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2012 මාර්තු 31** **වේලාව - ප.ව.01.30- ප.ව.04.30 දක්වා**

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.

ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. උස්කිස්තාන් රාජ්‍යයට එරෙහිව, තම පුත් ඩේවිඩ් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත තනි පුද්ගල සන්නිවේදනයක් (Individual Communication) යොමු කිරීමට රොනල්ඩ් මහතා අදහස් කරයි. මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කරන්නා වූ "මානව හිමිකම් සඳහා වන සංසදය" නම් රාජ්‍යය නොවන සංවිධානයෙන් ඔහු මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා සිටී. ඔබ, මානව හිමිකම් සඳහා වන සංසදයේ සේවය කරන නීතිඥවරයෙක් යැයි උපකල්පනය කරමින් පහත ලේඛණ කෙටුම්පත් කරන්න.

(i) මානව හිමිකම් කමිටුව වෙත තනි පුද්ගල සන්නිවේදනයක් යොමු කිරීමට පෙර සම්පූර්ණ කළ යුතු කොන්දේසි දක්වන ලේඛණය. (ලකුණු 10)

(ii) රොනල්ඩ් මහතා විසින් ලබා දුන් තොරතුරු මත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත යවන තනි පුද්ගල සන්නිවේදනය. (ලකුණු 15)

සටහන :

උස්කිස්තාන් රාජ්‍යය විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ 1 වන වෛකල්පිත සන්ධානය ද ඇතුළුව මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන ලේඛණ සියල්ලම අපරානුමත කර ඇති බවත් උස්කිස්තාන් රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සමාන වන බවත් උපකල්පනය කරන්න. ඔබ විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ අදාල වගන්තින් අනිවාර්යයෙන්ම උපුටා දැක්විය යුතු වේ.

අදාල සිද්ධිමය කරුණු:

පුපුරණ ද්‍රව්‍යය, උණ්ඩ හා ආයුධ භාවිතා කරමින් ගෙවල් බිඳීමේ වරද සිදුකර ඇතැයි සැකපිට උස්කිස්තාන රාජ්‍යයේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ, 2005 අගෝස්තු මස 09 වන දින පොලිස් නිලධාරීන් විසින් ඩේවිඩ්ව අත් අඩංගුවට

ගන්නා ලදී. අත් අඩංගුවට ගැනීමට වරෙන්තුවක් නොතිබුණ අතර අත් අඩංගුවට ගැනීමට හේතුවද ඩේවිඩ්ට දැනුම් නොදෙන ලදී. අත් අඩංගුවට ගැනීමෙන් පසු පාපොච්චාරණයක් ලබා ගැනීමේ අරමුණින් ඩේවිඩ්ව වධහිංසාවන්ට ලක් කරන ලදී. දින 3 ක් පුරා ඔහුට ආහාර ලබා නොදුන් අතර ඔහුගේ පවුලේ අය විසින් එවන ලද පාර්සලය ද ඔහුට ලබා නොදෙන ලදී. ඩේවිඩ්ගේ ඥාතීන්ට ද ඔහු වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා නොදුනි.

ඩේවිඩ් පාපොච්චාරණය නොකරන්නේ නම්, ඔහුගේ දෙමාපියන්ට බරපතල ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවන බවට දිගින් දිගටම ඩේවිඩ් වෙත කියා සිටින ලදී. තම පුතා වෙනුවෙන් රොනල්ඩ් මහතා විසින් උස්කිස්තානයේ ජාතික මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. ඉන් පසුව එම පැමිණිල්ල ඉවත් කර ගන්නා ලෙසට පොලිසිය විසින් රොනල්ඩ් මහතා වෙත තර්ජනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පැමිණිල්ල ඉල්ලා අස් කර ගන්නා ලදී. පහරදීම සහ මානසික පීඩනයන් දරාගත නොහැකිවීම මත ඩේවිඩ් විසින් පොලිසිය වෙත පාපොච්චාරණය කරන ලද අතර 2005 අගෝස්තු මස 16 වන දින ඔහුව අධිකරණය ඉදිරියට යොමු කරන ලදී.

උස්කිස්තානයෙහි නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ඩේවිඩ්ට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කරන ලදී. නඩු විභාගය අතරතුර දී ඩේවිඩ්ගේ හා ඔහුගේ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශයන් නොසලකා හරින ලදී. අභිචෝදක පක්ෂය විසින් සාක්ෂි කරුවන් වෙත පීඩනයක් එල්ල කරන ලද අතර ඩේවිඩ්ගේ නීතිඥයන්ට හරස් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ද ලබා නොදුනි. අධිකරණයද ස්වාධීන හා අපක්ෂපාතී ආකාරයෙන් ක්‍රියා කිරීමට අසමත් විය. නඩු විභාගය අවසානයේ ඩේවිඩ් ට වසර 20 ක සිර දඬුවමක් ලබා දෙන ලදී.

02. "නිසි කැමැත්ත ලබාදීමට දරුවකුට හැකියාවක් පවතින්නේද නැද්ද යන්න, අවශ්‍ය කරන්නා වූ කැමැත්තේ ස්වභාවය හා දරුවාගේ පරිණතභාවය මත තීරණය වේ. නිර්දේශිත ප්‍රතිකාරයකට අදාලව පවතින වාසි හා අවාසි සහගත තත්වයන් පිළිබඳ සාධාරණ තක්සේරුවක් කිරීමට දරුවාට හැකියාව තිබිය යුතු අතර, එසේ කැමැත්තක් ලබාදුනහොත් එය සත්‍යය කැමැත්තක් ලෙස නිවැරදිව හා සාධාරණව විස්තර කළ හැකි ය."

*Gillick V Norfork & Wisbech Area health authority (1986).Ac.112*

"දරුවාගේ කැමැත්ත" යන සංකල්පය ආධාර කර ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. අවශ්‍ය අවස්ථාවන්හි දී ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අදාල වගන්ති හා නඩු තීරණ ඔබගේ පිළිතුරට උපකාරී කරගත යුතුවේ.

(ලකුණු 25)

03. "අන්තර්ජාතික අපරාධ, බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වයන්ට නඩු කටයුතු ඇරඹීමට නොහැකි වන විට හා ඇරඹීමට අකැමැති වන විට ඊට සුදුසු ප්‍රතිකර්මයක්, අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව යටතේ පිළිගෙන ඇති අනුපූරකතාවයේ මූලධර්මය (Principle of complementarity) මගින් සපයනු ඇතැයි අදහස් කෙරේ."

ඉහත ප්‍රකාශය ආධාර කර ගනිමින්, අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ දැක්වෙන අධිකරණ පාත්‍රතා මූලධර්මයෙහි පවතින යහපත් හා අයහපත් ලක්ෂණ, කලින් පැවති තාවකාලික අපරාධ අධිකරණ පර්ෂදයන්හි අධිකරණ පාත්‍රතාව හා සංසන්දනාත්මකව දක්වන්න.

ඔබගේ පිළිතුර සඳහා අදාළ නෛතික ප්‍රතිපාදන සහය කොටගෙන තිබීම අනිවාර්යය වේ. (ලකුණු 25)

04. එක්සත් ජාතීන්ගේ වධහිංසාවට එරෙහි සම්මුතියේ (1984) 19 වන වගන්තියට අනුව යමින් වධහිංසාවන්ට එරෙහි කමිටුව වෙත ශ්‍රී ලංකා රජය විසින් යැවිය යුතු කාලීන වාර්තාව (Periodic Report) සකස් කිරීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් විශේෂඥ කණ්ඩායමක් හඳුනා ගන්නා ලදී. අදාල වාර්තාවේ කොටසක් ලෙස "එක්සත් ජාතීන්ගේ වධහිංසාවන්ට එරෙහි සම්මුතිය (1984) යටතේ භාර ගන්නා ලද වගකීම් ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග" යන තේමාව යටතේ ලේඛනයක් පිළියෙල කිරීමේ කාර්යය පැවරී ඇති, එම විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් ඔබ පත් කර ඇතැයි උපකල්පනය කරන්න.

අදාල ලේඛන පිළියෙල කරන්න. ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ව්‍යවස්ථාමය, ආයතනික හා වෙනත් ක්‍රියා මාර්ග ඔබගේ පිළිතුරෙහි අන්තර්ගත විය යුතුවේ.

(ලකුණු 25)

05. ට්‍රොෆිකානා දේශය වූ කලී විවිධ ජන ගෝත්‍රයන් ජීවත් වන රාජ්‍යයකි. එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් ශ්‍රී ලංකාවට සමාන වේ. නූර් (Noor) යනු එරටෙහි එක් ජන ගෝත්‍රයක් වන අතර මෑතකදී මොවුන්ගේ ජන ගෝත්‍රික උත්සවයකදී ඉඩම් අක්කර 10 ක් රජය විසින් මොවුනට ප්‍රදානය කරන ලදී. නූර් ජන ගෝත්‍රය විසින් කාලයක් තිස්සේ විවිධාකාරයේ සංස්කෘතිකමය ක්‍රියාවන් හා සිරිත් විරිත් පවත්වාගෙන යන අතර කාන්තාවන් සම්බන්ධයෙන් පහත දැක්වෙන ආකාරයේ පරිචයක් අනුගමනය කෙරේ.

මෙම ජන ගෝත්‍රය තුළ විවාහ වීමේ අවම වයසක් නොපවතින අතර විවාහය සඳහා ස්ත්‍රී පාර්ශවයේ කැමැත්ත අවශ්‍යය නොවේ. නූර් ජන වර්ගයට අයත් කාන්තාවන්ට කුමන ආකාරයේ හෝ උපත් පාලන ක්‍රම භාවිතා කිරීම තහනම් කර ඇති අතර විවාහ වූ සැනින් දරුවන් ලැබීම කාන්තාවකගෙන් අපේක්ෂා කෙරේ. තවද, නිවසින් පිටත්වීම සඳහා කාන්තාවක් විසින් තම පියාගේ හෝ ස්වාමි පුරුෂයාගේ අවසරය ලබා ගත යුතු වේ. කෙසේ වුවද, කාන්තාවන්ට එරෙහිව හිංසාකිරීම් හා අපයෝජන නොඉවසන මෙම ගෝත්‍රිකයෝ එවැනි වරදකට වරදකරුවකු වන අයකුට මරණ දඬුවම නියම කරයි.

මෙම ගෝත්‍රයේ ගැහැණු දරුවකු වන බිකු (Biku) ඔහුගේ පියා විසින් ඇයගේ ස්වාමියා ලෙසට යෝජනා කරන ලද කුන් (kun) හා විවාහ වීම ප්‍රතික්ෂේප කළා ය. බිකුගේ පියා මේ සම්බන්ධයෙන් ගෝත්‍ර නායකයකුට පැමිණිලි කළේ ය. පසුව ගෝත්‍ර නායකයන් විසින් ගෝත්‍රයේ සිරිත් විරිත්වලට අනුව විවාහ උත්සවය සූදානම් කොට බිකු, බලෙන් කුන්ට විවාහ කර දෙන ලදී. විවාහයත් සමගම දරුවකු ලැබීමට බිකු අකමැති වන අතර මෙය මෙම යුවළ අතර තර්ක හා රණ්ඩු ඇතිවීමට හේතුව විය. දිනක් රණ්ඩුවක් අතරතුරදී කුන් විසින් බිකුට පොරවකින් පහර දෙන ලදී. බිකු ගෝත්‍රය අතහැර පලා ගියාය.

(i) දේශීය හා අන්තර්ජාතික මට්ටම් වලදී, නූර් ගෝත්‍රයේ පරිචයන් ප්‍රශ්න කිරීමට බිකුට අවශ්‍ය වේ. ඔබ ඇයට උපදෙස් දෙන්නේ කෙසේද ?

(ලකුණු 13)

(ii) විවිධ වූ ජන ගෝත්‍රයන්ට අදාල සියළුම පරිචයන් හා සිරිත් විරිත් අවලංගු කරමින් එක් පොදු දැඩි ව්‍යවස්ථාවක් ඇති කිරීමට ට්‍රොපිකානා රාජ්‍යය තීරණය කර ඇතැයි උපකල්පනය කරන්න. මෙම විසඳුම ට්‍රොපිකානා රාජ්‍යයේ ජනතාව අතර සාමකාමී සහයෝගිතාවය ඇති කරන විසඳුමක් වේ යැයි ඔබ සිතන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 12)

06. (i) දේශීය හා අන්තර්ජාතික තලයන්හි මානව හිමිකම් ආරක්ෂාව සම්බන්ධව ඇති කරන ලද ප්‍රධාන අන්තර් ජාතික මානව හිමිකම් ලියවිලි යටතේ ඇති කරන ලද සන්ධාන බැඳි යාන්ත්‍රණයන්හි (Treaty based mechanism) ප්‍රධාන කාර්යය භාරයන් කවරේ ද? (ලකුණු 12)

(ii) ප්‍රඥප්තිය මත පදනම් වූ යාන්ත්‍රණ (charter based mechanism) හා සන්ධාන බැඳි යාන්ත්‍රන (Treaty based mechanism) අතරින් මානව හිමිකම් ආරක්ෂා කිරීමේ දී වඩා ප්‍රතිඵලදායි ක්‍රමය ලෙස ඔබ යෝජනා කරන්නේ කුමක් ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 13)

- හිමිකම් ඇවිරිණි. -